# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1783/37 - 2012 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2012.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**අංක 1670/32 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය**

2010.09.10 වැනි දින අංක 1670/32 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය පහත සඳහන් පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත සංශෝධනය කරනු ලැබේ :–

06 නිලධර ගණයට අයත් තනතුරු

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 832 { I, II, III } ශ්‍රේණි

10.3 ශ්‍රේණියේ සිට විශෙෂ ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශෙෂ ශ්‍රේණියේ පවත්නා පුරප්පාඩු මත විශෙෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අමාත්‍ය මණ්ඩලය විසින් බලය පවරනු ලබන බලධාරියා මගින් හෝ සිදු කරනු ඇත.

ඒ අනුව නිලධාරියකු –

(i) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ වසර 18 ක සේවා කාලයක් හා I ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ උසස්වීම් සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වසර 05ක කාල සීමාව තුළ නියමිත දිනයන්හිදී සියලු වැටුප් වර්ධක උපයා ගෙන තිබීම ;

(ii) උසස්වීම් සඳහා පූර්වාසන්නයෙන් වූ වසර 05 ක කාලසීමාව තුළ කර ඇති වරදක් සඳහා විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබීම ; (අවවාද කිරීම් හැර)

(iii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් සඳහා පූර්වාසන්න වූ වසර 05ක කාලසීමාව තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධන මට්ටමක් ලඟාකර ගෙන තිබීම.

පත් කිරීම් බලධාරියා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඉහත සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කර බලා කරනු ලබන නිර්දේශ අනුව එම සුදුසුකම් සපුරාලන නිලධාරීන් සුදුසුකම් සියල්ල සපුරාලන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි සේවයේ විශෙෂ ශ්‍රේණියේ පුරප්පාඩු මත විශෙෂ ශ්‍රේණියට උසස් කිරීම, පත් කිරීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

පී. බී. ජයසුන්දර,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2012 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

11 - 921

1A - G 016867 — 340 (2012/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.